නිපුණතාව 3.0 - විස්තරාත්මක සංඛ්‍යාන ශිල්පීය ක්‍රම භාවිතයෙන් ව්‍යාපාර දත්ත විශ්ලේෂණය කරයි.
නිපුණතා මට්ටම 3.2 - විශේෂිත කේන්ද්‍රික ප්‍රවණතා මිනුම් භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරයි.

1.A,B,C නම් භාණ්ඩ වර්ග තුනක් පමණක් අලෙවි කරන එක්තරා ව්‍යාපාර ආයතනයක් ප්‍රතිපත්තියක් වශයෙන් A භාණ්ඩයේ මිල වසරකට රු.10කින්ද,B භාණ්ඩයේ මිල වසරකට රු.50කින්ද,C භාණ්ඩයේ මිල රු.20කින්ද ඉහළ නංවයි.භාණ්ඩ වර්ග තුනම සැලකූ විට ව්‍යාපාර ආයතනයේ භාණ්ඩවල මිල වැඩිවීම වසරකට රුපියල් කීයද?

2.කුටුම්භයක ආහාර පරිභෝජනය සැලකිල්ලට ගත් විට 40%ක් ධාන්‍ය වර්ග ද 25%ක් එළවළු වර්ග ද ,20%ක් පළතුරු වර්ග ද,15%ක් මාංශ වර්ග ද වේ.එක් එක් ආහාර වර්ගයන් හා කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය මිල පහත දැක්වේ.

ධාන්‍ය රු.100
එළවළු රු.60
පළතුරු රු.180
මාංශ රු.300

ඉහත කුටුම්භයේ ආහාර කිලෝග්‍රෑමයක සාමාන්‍ය මිල කොපමණද?